Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : ව්‍යාපාර අධ්‍යයනය

සතිය- 18

ශ්‍රේණිය: 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව: 13.0 - ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා මෙහෙයුම් කළමනාකරණයේ දායකත්වය අගයයි.

නිපුණතා මට්ටම: 13.6 - ප්‍රශස්ත තොගයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තොග මට්ටම් නිශ්චය කරයි.

තොග මට්ටම් ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු

1.කාලච්ඡේදයට අදාළ ද්‍රව්‍ය පරිභෝජනය (භාවිතය)
2.යළි ඇණවුම් කාලය
3.යළි ඇණවුම් ප්‍රමාණය

- දිනක,සතියක,මාසයක ආදී වශයෙන් කිසියම් නිශ්චිත කාලච්ඡේදයක නිෂ්පාදන කටයුතු සඳහා හෝ අලෙවි කටයුතු සඳහා ද්‍රව්‍ය ප්‍රමාණය කාලච්ඡේදයට අදාළ ද්‍රව්‍ය පරිභෝජනය ලෙස හැඳින්වේ.

1.ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) යනු කුමක්ද?
2.අවම තොග මට්ටමට වඩා ගබඩාවේ තොගය පහළ ගියහොත් ඇතිවන අහිතකර ප්‍රතිඵල මොනවාද?
3.ගබඩාවක තිබිය හැකි උපරිම තොග ප්‍රමාණය ඉක්මවා තොග රැස්කළ විට ඇතිවන අහිතකර ප්‍රතිඵල මොනවාද?
4.අශානි ව්‍යාපාරයේ තොග සම්බන්ධ එක් ද්‍රව්‍ය අයිතමයකට අදාළ තොරතුරු පහත දැක්වේ.
අවම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 40
උපරිම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 60
යළි ඇණවුම් කාලය - අවමය දින 10
උපරිමය දින 15
යළි ඇණවුම් ප්‍රමාණය - ඒකක 3000

ඉහත තොරතුරු ඇසුරෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

1.යළි ඇණවුම් මට්ටම
2.අවම තොග මට්ටම
3.උපරිම තොග මට්ටම
4.සාමාන්‍ය තොගය

ඉහත තොග මට්ටම් ප්‍රාස්තාරිකව නිරූපණය කරන්න.